13

හොඳ ළමයා නුවණිනී
හොඳ දේ තෝරා ගනී

ළමයින්ගේ කියවීම සඳහා සම්පාදනය කෙරෙන ගද්‍ය, පද්‍ය, නාට්‍ය ආදි නිර්මාණ ළමා සාහිත්‍ය නිර්මාණ ලෙස හැඳින්වේ. අකුරු හුරු වන අවධියේ සිට අවුරුදු දොළහ පමණ දක්වා දරුවන් උදෙසා රචනා කෙරෙන කෘති මේ ගණයට අයත් වේ. අදාළ වයස් මට්ටමේ දරුවන්ට උචිත භාෂා භාවිතය හා අද්දැකීම් භාවිතය මෙහි දී අතිශය වැදගත් වේ. දරුවන්ගේ භාෂා ඥානය හා වාක්කෝෂය පුළුල් කිරීම ද ළමා සාහිත්‍යයෙන් අපේක්ෂිත ය. සිංහල ළමා සාහිත්‍ය නිර්මාණ පිළිබඳව ඔබට මේ පාඩමෙන් යම් කිසි අවබෝධයක් ලබා ගත හැකි ය.

දරුවන් හට මහත්	-	තැතක් නැති වැ මැ වැටැහෙන
උන්ගේ සිත් පුබුදුවන	-	ඇඟපත නිකම් නටවන
යහළුවන් සමගින්	-	සසඳන්ට පොලඹවන
උන් කියවනු ඇසූ	-	වැඩිහිටියවුන් පහදවන
විසිතුරු පබැඳුමෙකි	-	එ වයසට කිවියෙක් නම්

යනුවෙන් කුමාරතුංග මුනිදාසයන් කර ඇති විවරණය ළමා සාහිත්‍යයේ ලක්ෂණ මනාව ප්‍රකට කරයි. සරල, රසවත්, ළමා ජීවිත හැඩ ගැස්වීමට මග පෙන්වන, ළමයින් වෙනුවෙන් රචනා කර ඇති නිර්මාණ, උසස් ළමා සාහිත්‍ය නිර්මාණ ගණයෙහි ලා සැලකිය හැකි ය.

පැරණි සාහිත්‍යයෙහි ළමා කවි ගී සේ අපට හමු වනුයේ කෙළි සෙල්ලම් පිණිස යොදා ගත්, පොදු ජනයා විසින් මුඛ පරම්පරාගතව පවත්වා ගෙන ආ නිර්මාණ යි. නිදසුන් ලෙස "නුඹෙ අම්මා කිරට ගියා කිරි එරවා එන්ට ගියා", "ටිකිරි ටිකිරි ටිකිරි ලියා - කළෙත් අරන් ළිඳට ගියා", "අතුරු මිතුරු දඹදිව තුරු රාජ කපුරු සෙට්ටියා", "කොප්පර කොප්පර පිපිඤ්ඤා" වැනි කුඩා කල අප කවුරුත් රස විඳි කවි දැක්විය හැකි ය. මහදැනමුත්තාගේ කතා, අන්දරේගේ කතා ද මෙසේ ජන වහර ඔස්සේ ළමයින් අතර ප්‍රකට විය.

ළමයකු ගැන ලියැවුණු, සිංහලයේ එන පැරණි ම පද්‍ය නිර්මාණය ලෙස සැලකෙන්නේ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ **කාව්‍යශේඛරයෙහි** එන සේනක පඬිතුමාගේ ළදරු විය විස්තර කිරීමට යොදා ගත් පහත කවිය යි. ශ්‍රී රාහුල හිමියන් මේ කවියෙන් ව්‍යංග්‍යාර්ථයෙන් නිරූපණය කර ඇත්තේ උන් වහන්සේ රාජ මාලිගයෙහි ගෙවූ කුඩා කාලය යයි මතයක් ද ඇත.

දත් කැකුළු	පාලා
සුරතල් සිනා	සීලා
බොළඳ බස්	දීලා
කෙළී සියොලඟ දූලි	ගාලා

මේ කුඩා කවිය දණගාමින් ඇවිදින සුරතල් දරුවකුගේ චිත්‍රයක් මවා පෑමට සමත් වෙයි. එහි වදන් සරල ය; සුගම ය. ඇතැම්හු කවි තැනීමේ දී විරිත රැක ගැනීමට යොදන අනවශ්‍ය වදන් කිසිවක් මෙහි නැත. වදන් ගළපා ඇත්තේ පැහැදිලිව නිරවුල්ව අදහස ප්‍රකාශ වන පරිදි ය. මෙවැනි ම කවියක් රාහුල හිමියන් කුඩා කල කියූ බව ජනශ්‍රැතියෙහි ද එයි. කුඩා කුමරුන් සිරි පැරකුම්බා රජතුමා වෙත පැමිණවූ අවස්ථාවේ රජු ඔහුගේ සුවඳුක් විචාරා කවියක් කියන්නැයි කී විට මේ කවිය හිටිවන ම කී බව සඳහන් වේ.

මා වැනි	බිලින්දා
වර වර ළඟට	කැන්දා
දුක් සැප	කුමන්දා
අසන නිරිඳෝ වෙන	කොයින්දා

සිංහල ළමා සාහිත්‍යයක් පිළිබඳ පැහැදිලි සාධක අපට හමු වන්නේ විසි වන සියවසේ සිට ය. යටත් විජිත සමයේ අධ්‍යාපනය පිළිබඳව වර්ධනය වූ ප්‍රබෝධය ළමා සාහිත්‍ය නිර්මාණ බිහි වීමට මූලිකව බල පෑ බව වියතුන්ගේ මතය යි. ළමයින් සඳහා ප්‍රථම සිංහල මුද්‍රිත කෘතිය ලෙස සැලකෙන්නේ ඩබ්. වී. අන්දිරිස් අප්පුහාමි ලියූ **හෝඩි පොත** යි. ළමයින්ගේ ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ලියැවුණු **බාලාවබෝධනය, නන්දන හෝඩි පොත, නොදන්නා හෝඩි පොත** ආදි හෝඩි පොත් ඇසුරෙන් නූතන සිංහල ළමා සාහිත්‍යය ඇරඹුණු බව විශ්වාස කෙරේ. පන්ති කාමරයේ කියවන පොත්වලට අමතරව අතිරේක කියවීම් සඳහා පොත් බිහි වීම ඔස්සේ සිංහල ළමා සාහිත්‍යය වර්ධනය විය.

1915 දී ඒ. රෙජිනෝල්ඩ් විසින් **අභිනව අරාබි නිසොල්ලාසය** නමින් ද 1916 දී ඩී. ජේ. කුලතිලක විසින් **අලිබබා සහ හොරු හතළිහ** නමින් ද ළමා පරිවර්තන කෘති එළිදක්වා තිබේ. එමගින් ළමයින්ට අද්භූත රසයෙන් පිරි කතා සමීප කරවීමට ඔවුන් උත්සාහ ගෙන තිබිණි. 1927 දී චාර්ලිස් කරුණාතිලක **මගේ සිරිත** ද ඩබ්. ශ්‍රී ධීරාලංකාර **ළමා කවි මල්දම** ද 1929 දී ආනන්ද රාජකරුණා **ළදරු ගී** ද වී. ඩබ්. සමරනායක **ළමා පහන** නමින් ද ළමා පද්‍ය කෘති එළිදක්වා තිබේ. ළමා ගද්‍ය සාහිත්‍ය සම්ප්‍රදාය අරම්භ වීමට පෙරාතුව ළමා පද්‍ය සම්ප්‍රදාය ක්‍රමිකව වර්ධනය විය. නූතන ළමා ගද්‍ය සාහිත්‍යයේ පුරෝගාමියා ලෙස සැලකිය හැක්කේ වී. ඩී. ද ලැනරෝල් ය. **අන්දරේ හෙවත් රජවාසල කවටයා, මහදැනමුත්තා සහ ගෝල පිරිස, ඇලඩින්ගේ පුදුම පහන, අලිබබා හා හොරු හතළිහ, පද්මාවතී** වැනි ළමා සාහිත්‍ය කෘති ගණනාවක් ඔහු රචනා කර ඇත්තේ අතිරේක කියවීම් පොත් වශයෙනි. ඇතැම් කෘති සඳහා විදේශීය සාහිත්‍යයේ ආභාසය ද ලැබී ඇත.

ළමා කාව්‍යයෙන් හා ළමා කතාවෙන් ආරම්භ වූ නූතන සිංහල ළමා ප්‍රබන්ධ සාහිත්‍යය අනතුරුව සාහිත්‍යයේ එක් ප්‍රවර්ගයක් ලෙස වර්ධනය වූයේ ළමා ගීත, ළමා නාට්‍ය ආදි අනුප්‍රභේද ගණනාවක් ද එක් කර ගනිමිනි. ආරම්භයේ සිට නූතනය දක්වා ලියැවුණු ළමා සාහිත්‍ය කෘති සංඛ්‍යාව බොහෝ ය.

සිංහල ළමා සාහිත්‍යයේ ආරම්භක අවධියේ දායකත්වය සැපයූ නිර්මාණකරුවන් ලෙස වී. ඩී. ද ලැනරෝල්, තියඩෝර් ජී. පෙරේරා, ආනන්ද රාජකරුණා, මාරි මියුසියස්, කුමාරතුංග මුනිදාස, ටී. එස්. ධර්මබන්ධු, හියුබත් දිසානායක, ඇලෙක්සැන්ඩර් වැලිවිට, මාර්ටින් වික්‍රමසිංහ, පී. ඩී. ඇස්. වීරසූරිය, අලවු ඉසි සැබිහෙළ, චන්ද්‍රරත්න මානවසිංහ, කරුණාරත්න අබේසේකර ආදීන් හඳුනා ගත හැකි ය.

ආනන්ද රාජකරුණා නූතන ළමා කවියේ මෙන් ම ගීයේ ද පුරෝගාමී රචකයා ය. **ළදරු ගී, ළමා උයන, ළදරු කවි, ළදරු කවි මග** හා **ළදරු කවි මී** වැනි කාව්‍ය ග්‍රන්ථ රචනා කළ ආනන්ද රාජකරුණා ළමා ලෝකය හා ළමා මනස මනාව හඳුනා ගත් රචකයෙකි. **රෝස මලේ නටුවෙ කටු, දිලිහි දිලිහි ආකාසේ** වැනි ප්‍රකට ළමා කවි මගින් ඔහුගේ කුසලතාව පිළිබිඹු වේ. පහත දැක්වෙන්නේ ද ඔහුගේ නිර්මාණයකි.

මේ හිරු - රැස් වැටී
ලා උදේ ලස්සන
මල් පිපී - ලා අහෝ
මේ ගහේ ලස්සන

රොන් පැණි - බොන්නට මී
මැස්සි ආ ලස්සන
ලෝකයේ - මල් නැතොත්
කොයි ද මේ ලස්සන

කව්මිණ, කව්මුතු, ළමා කවි කළඹ, ඔවා මුතුදම, නන්දන ගීත, දරු නැළවිල්ල හෙවත් **ජාතික තොටිල්ල** වැනි ළමා පද්‍ය සංග්‍රහ රාශියක් රචනා කළ ඇස්. මහින්ද හිමි ළමා සාහිත්‍යයේ අධ්‍යාපනික පරමාර්ථ ද මනාව හඳුනා ගත් රචකයෙකි. **මුනි සිරිපා සිඹිමින්නේ, සමන්පිච්ච මල් ඉහිරුණු** ආදි ළමා කවි නූතන ළමා පරපුර අතර ද එක සේ ජනප්‍රිය වීමෙන් පැහැදිලි වන්නේ උන් වහන්සේගේ අසහාය කවිත්වය යි. ළමා කාව්‍යයට කවි කතා ආකෘතිය ද හඳුන්වා දුන් මහින්ද හිමි, ළමා සිතුවිලි දේශවාත්සල්‍යයෙන් ඔප්නැංවීමට ළමා කවිය උපයෝගි කර ගත්තේ ය.

ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ
එය රැක ගන්නට මෙලොවේ
සමත් වෙතොත් පුත නුඹ වේ

සරල බස් වහරක් භාවිතයෙන් ළමා සිතට ගැඹුරු අදහසක් ලබා දීමට උන් වහන්සේ දරා ඇති උත්සාහය පහත නිර්මාණයෙන් ප්‍රකට කෙරේ:

මොනව ද මුත්තේ මොක ද කරන්නේ
මොකටද උඹ ඔය බිම හාරන්නේ

උඹටත් ළමයෝ නොපෙනෙයි නොසිතමි
අඹ ඇටයක් සිටුවන්නට හාරමි

දුක සේ සිටුවා අඹ ඇටයක් අද
එක අඹයක් වත් කන්න ලැබේවි ද

මම ළමයෝ මින් අඹයක් නොපතමි
යුතුකම පමණක් ඉටු කොට තබනෙමි

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

යහපත් ළමයකු සතු විය යුතු ගතිගුණ ළමා මනසට ගැළපෙන පරිදි ප්‍රතිනිර්මාණයට මහින්ද හිමි කටයුතු කළේ ය. පහත කවිය ඊට නිදසුනකි.

මල්වල සුමිහිරි පැණී
ඇද බොන බමරා මෙනී
හොඳ ළමයා නුවණිනී
හොඳ දේ තෝරා ගනී

හීන්සැරය, **මඟුල් කෑම**, **හත්පණ** නම් වූ ප්‍රකට ළමා ගද්‍ය සාහිත්‍ය කෘති රචනා කළ කුමාරතුංග මුනිදාස මහතා ළමා පද්‍ය සාහිත්‍යයට ද ප්‍රාමාණික මෙහෙවරක් ඉටු කළ රචකයෙකි. **හාවාගේ වග**, **නැළවිල්ල**, **සිරිමත්**, **මල් බස්**, **වෙළෙන්දී** වැනි ළමා පද්‍ය නිර්මාණ කිහිපයෙන් වුව ඔහුගේ ප්‍රතිභාව විශද වේ. කුමාරතුංග හුදු උපදේශාත්මක ළමා කතා රචනයෙන් බැහැර වූ, ස්වතන්ත්‍ර ළමා සාහිත්‍ය කලාවක අගය හඳුනා ගත්, ළමා මනෝවිද්‍යා සංකල්ප ද විශිෂ්ට ලෙස අවබෝධ කර ගැනීමේ හැකියාවෙන් යුත් අයකු බව ඔහුගේ නිර්මාණාවලිය විමසා බැලීමෙන් පසක් වෙයි.

ගස වතු සුදු
වී පිරිසිදු
පොහොය නැතිදු
සිල්ගත් බඳු

දවසක් රා ටිකක්
ලැබ බීමත්ව මීයෙක්
බළලා වී මතක්
මෙසේ කීයේ උඩඟු වදනක්

ජී. බී සේනානායක, මහගම සේකර, ජයරත්න සමරසේකර, සුනිල් ජයවීර, කේ. ජයතිලක, ඩබ්ලියු. ඒ. අබේසිංහ, ගුණසේන විතාන ආදීන් ද ළමා සාහිත්‍යයට දායකත්වය සපයා ඇත. සිංහල ළමා සාහිත්‍ය නිර්මාණ විදේශීය භාෂාවලට පරිවර්තනය වීම මෙන් ම එම නිර්මාණ විදේශීය සම්මානවලට පාත්‍ර වීම ද සිංහල ළමා සාහිත්‍යයේ සුවිශේෂ කඩ ඉමක් ලෙස හඳුනා ගත හැකි ය. මේ වන විට ද ළමා සාහිත්‍යකරණයේ නිරතව සිටින සිබිල් වෙත්තසිංහගේ කෘති ගණනාවක් චීනය, ජපානය, කොරියාව, පිලිපීනය, නෝර්වේ, ස්වීඩනය, ඩෙන්මාර්කය, ඇමෙරිකාව ඇතුළු රටවල් රාශියක භාෂා ගණනාවකට පරිවර්තනය වී තිබේ. ඇයගේ **කුඩහොරා**, **වෙසක් පහන**, **දුවන රැවුල** යන ළමා සාහිත්‍ය කෘති අන්තර්ජාතික සම්මාන රැසකින් පිදුම් ලැබී ය.

ළමා කතා, ළමා කාව්‍ය, ළමා ගීත සංග්‍රහ, ළමා කවි කතා, ළමා නාට්‍ය වශයෙන් අනුප්‍රභේදවලට වර්ග කළ හැකි ළමා සාහිත්‍ය කෘතිවලින් නූතන සිංහල ළමා සාහිත්‍යය පෝෂණය වී තිබේ.

ළමා සාහිත්‍යයේ වස්තු විෂය ගහකොළ, සතුන් ආදි අවට පරිසරය, ස්වභාවික වස්තු, එදිනෙදා ජීවන අද්දැකීම්, විවිධ පුද්ගලයන්, සුරංගනාවන්, රාක්ෂසයන් ආදි පුළුල් ක්ෂේත්‍රයක පැතිර පවතී. මනඃකල්පිත වස්තු ළමා සාහිත්‍යයේ දී ප්‍රබල ලෙස භාවිත කෙරෙයි.

දරුවාගේ ලෝකයේ වලාකුළු කතා කරයි. ගස්ගල්වලට ද වේදනාව දැනෙයි. කුරුලු සිවුපාවුන්ට ද අපට තේරෙන බසක් ඇත. අපේ බස උන්ට ද වැටහෙයි. ගංගාවලට ද දිය ඇලිවලට ද සිත් පිත් ඇත. හිරු සඳු මෙන් ම සුවහසක් තාරකාවෝ ද දරුවන්ගේ මිතුරෝ වෙති. විෂය ලෝකය හා දරුවාගේ ඇති මේ බැඳීම අනිවාර්ය වූ ද ස්වාභාවික වූ ද බැඳීමකි.

ඩබ්ලියු. ඒ. අබේසිංහ

ළමා ලොවෙහි දී සතුන් කතා කරන අතර, අචේතනික වස්තුහු සප්‍රාණිකත්වය ලබති. රත්න ශ්‍රී විජේසිංහගේ **සින්දු කියන උණ පඳුර** කෘතියේ උණ පඳුර සජීව චරිතයක් බවට පත් වෙයි.

තම දිවි බේරා දීම ගැන සතුටින් ඉපිල උණ පඳුර උද්දාමයෙන් දලුකොළ සලමින් සිටියා. සුළඟත් එක්ක සෙල්ලම් කළා. උණපඳුර දෙසින් ගීතයක් වැනි සිහින් හඬක් ඇසෙන්නට වුණා.

ඔහුගේ ම **ගඟ ළඟ දී** පද්‍ය පන්තියෙහි එන මෙය ද එබඳු තවත් නිදසුනකි.

කුඹුක් අත්ත ගඟට වැටී
වතුර අත ගගා
දැක්ක ද පැණි කුරුල්ලෙකුට
වතුර ඉහිනවා

- සැලළිහිණියෝ

ස්වභාව ධර්මයේ විවිධ සංසිද්ධි ද ළමා සාහිත්‍ය නිර්මාණයේ දී ප්‍රබල වස්තු විෂය බවට පත් වෙයි. ඩබ්ලියු. ඒ අබේසිංහගේ නිර්මාණවලින් උපුටා ගන්නා ලද පහත නිදර්ශන බලන්න.

හිරු මඬලට පාර ද මේ
සඳ මඬලට පාර ද මේ
කිරි මුහුදට පාර ද මේ
කියන්න දේදුන්නේ...

වලාකුළේ රන් පාටට
විදුලි කොටනවා
ආකාසේ හඬ තළමින්
අකුණු හඬනවා

ළමයින්ට වඩාත් සමීප චරිතයක් වන ‘අම්මා’ ද ළමා සාහිත්‍යයේ නිරන්තරයෙන් අපට හමු වෙයි.

මුහුදක කිරි දුන් අම්මා
මිහිකත දුක් දැරූ අම්මා
රන් සමනොළ ගිර මුදුනේ
සිරිපා පද්මය අම්මා

මතු දා බෝසත් වෙම්මා
කර පිට හිඳුවම් අම්මා
රුදු සත් සමුදුර පීනා
එතෙර කරන්නෙමි අම්මා

- **ඩබ්ලියු. ඒ. අබේසිංහ**

ගෙයින් ගෙයට ගෙදර බුදුන්
අම්මා යැයි කියනවා
බුදු සමිඳුට වඳින ලෙසින්
දෑත නගා වඳිනවා
සිතේ උපන් කරුණාවට
රන් කිරි බිඳු එරෙනවා
එරන් කිරේ සුවඳ ලබා
අපි ලෝකය දිනනවා

- **ලක්ෂ්මන් කහටපිටිය**

පරිසරය හා ළමයා අතර සබඳතාව ගොඩ නැංවීමේ ලා ළමා සාහිත්‍යයේ කාර්යභාරය සුවිශේෂ වේ. පරිසරයේ අන්‍ය වස්තූන් තමා හා සමානව සැලකීමට ළමයා පොලඹවන සාහිත්‍ය නිර්මාණ ළමයා පරිසරයට ආදරය කරන මිනිසකු බවට පත් කරයි. පරිසරයට පමණක් නොව තමා උපන් බිමට හිතැති පුරවැසියකු සේ ළමයාගේ පෞරුෂය වර්ධනය කිරීමට ළමා සාහිත්‍යයේ දායකත්වය වැදගත් වේ. එස්. මහින්ද හිමියන්ගේ දේශාභිමානී නිර්මාණ මෙයට නිදසුන් කළ හැකි ය. මහගම සේකරගේ **සරු පොළොවක් අපට ඇතේ** කෘතිය ද ළමා සිත්වල අප රටේ පරිසරය, ජීවන රටාව, විශ්වාස ආදිය පිළිබඳව හැඟීමක් ජනනය කරයි.

පාට පාට මැණික් ජාති
පසට යටින් කැටි වේ
රත්න දීප පොළොව තුළින්
ධන නිධාන මතු වේ

පලා පැහැය හැම කල්හි ම
රැඳී දිලෙන පොළොවේ
ඉවත දමන දඬුව වුව ද
දලු ලා යළි පැළ වේ

- **මහගම සේකර**

සමනොළ හිම කඳු මුදුනේ
සිරිපා සලකුණ ඇඳී
ජාතිය එකමුතු කරවයි
සම කරුණාවෙන් බැඳී

ඉරු දෙවි මුහුදින් ඇදී
සමනොළ කන්දට වඳී
එතකොට මුළු ලංකාව ම
දිලිහෙයි ලස්සන වෙවී

- **මහගම සේකර**

ළමා මනසෙහි රසිකත්වය දියුණු කිරීම පමණක් නො ව, පිරිපුන් පෞරුෂයක් ගොඩ නැගීම උදෙසා ද ළමා සාහිත්‍යයේ කාර්යභාරය අනභිභවනීය වේ. කෙසේ වුව ද හුදු රසාස්වාදයට සීමා වීම මෙන් ම නීරස ලෙස උපදේශාත්මක වීම ද ළමා සාහිත්‍ය නිර්මාණයක ගුණාත්මකභාවය හීන කරවයි. ළමා ලෝකය රසයෙන් පුරවමින් වඩා හරවත් ජීවිතයකට මගපෙන්වන ළමා සාහිත්‍ය නිර්මාණ රස විඳිමු.

විල් ජලයේ ගොහොරු මඩේ
සුදු රතු සියපත් පිපේ

අවලස්සන කොවුලු තුඩේ
පන්සිළු වෙණ නද නැගේ

කැත බෙල්ලකු කුස ඇතුළේ
සුදු මුතු ඇටයක් වැඩේ

හොඳ ළමයින් මුතු වගේ ය
හොඳ ගුණ දම් මුතු අගේ ය

- ඩබ්ලියු. ඒ. අබේසිංහ

අවබෝධය

1. ළමයින් සඳහා කියැවුණු පැරණි ම පද්‍ය නිර්මාණය හමු වන්නේ කිනම් ග්‍රන්ථයක ද? එය රචනා කළේ කවුද?
2. ළමා නිර්මාණ සඳහා පාදක කරගෙන ඇති වස්තූන් කීපයක් පාඩමෙන් සොයා ලියන්න.
3. ළමා සාහිත්‍ය නිර්මාණ සඳහා යොදා ගන්නා බස් වහර කෙබඳු විය යුතු ද?
4. පහත වචනවල තේරුම ඔබේ වචනයෙන් ලියන්න.

i. දේශවාත්සල්‍යය
ii. පරිවර්තනය
iii. අචේතනික
iv. පුරෝගාමියා
v. ජනශ්‍රැතිය



තනි පද

විවිධ අර්ථ සහිත පද කිහිපයකින් යුක්ත යෙදුමක් හෝ වාක්‍යාංශයක් සඳහා ඒ වෙනුවට යෙදිය හැකි, ඒ අර්ථ සියල්ල කැටි කොට ගත් ප්‍රකාශයකින් යුක්ත පද, තනි පද ලෙස හැඳින්වේ. එමගින් අදහස් රාශියක් ඉක්මනින් හුවමාරු කර ගැනීමට හැකි වන අතර භාෂාවේ සංක්ෂිප්තභාවය ද ආරක්ෂා වේ.

උදාහරණ:

අනුන් විසින් පෝෂණය කළ	පරපුටු
අවුරුද්දක් පාසා පැවැත්වෙන	සාංවත්සරික
උසට ගැළපෙන මහතින් යුත්	ආරෝහපරිණාහ
කැලෑවේ ඉබේ හටගන්නා ගින්න	ළැව්ගින්න
කිසිවකුට දෙවැනි නොවන	අද්විතීය
කිසි ම ප්‍රයෝජනයකට නැති	නිෂ්ප්‍රයෝජන
කෙළෙහි ගුණ නොසලකන	අකෘතඥ
ගලින් නිමවන ලද	ශෛලමය
දියෙහි උපන්නා වූ	ජලජ
දුරදිග බලා කටයුතු කරන	දූරදර්ශි

බහු අර්ථ පද

සිංහල භාෂාවේ ඇතැම් වචනවල අර්ථයක්, දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් තිබිය හැකි ය. එක් පදයකින් බොහෝ අර්ථ නිරූපණය කළ හැකි විට එය බහු අර්ථවත් පදයක් ලෙස දැක්විය හැකි ය. මෙහි විශේෂත්වය වන්නේ එක ම පදය, එක ම වාක්‍යය තුළ වුවත් වෙනත් වෙනත් අර්ථ ප්‍රකාශ කිරීම සඳහා යොදා ගැනීම යි. ඒ අනුව මෙබඳු පදවලින් ප්‍රකාශ වන නිශ්චිත අර්ථය නිවැරදිව අවබෝධ කර ගැනීමට නම් එම වචනය යෙදී ඇති වාක්‍ය පරිසරය ද අවබෝධ කර ගත යුතු ය.

උදාහරණ:-













නොමිලේ බෙදා හැරීම සඳහා ය.

සවන් දී උගනිමු

භාෂාවක ඇති චතුර්විධ කුසලතා ලෙස සවන් දීම, කතා කිරීම, කියවීම හා ලිවීම හඳුන්වා දිය හැකි ය. ඒ අතරින් තොරතුරු ලබා ගැනීමේ මූලික ක්‍රමය වන්නේ සවන් දීම හෙවත් ශ්‍රවණය යි. සාවධානව සවන් දීම මගින් යහපත් රසාස්වාදයක් මෙන් ම නිවැරදි අවබෝධයක් ද ලබා ගත හැකි ය.

ලිඛිත අභ්‍යාස

1. **ළමා සාහිත්‍ය නිර්මාණයක් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවා ද?**
2. **පහත දැක්වෙන එක් එක් කවියට ගැළපෙන තවත් කවිය බැගින් නිර්මාණය කරන්න.**

i. අහස පුරා නිල් කහ දම්
පාට හතයි දේදුන්නට
හරි පුදුමයි කවුද ඇන්දෙ
ලස්සන දේදුන්න

ii. උදේ පිපෙන මල් අපී
රැයේ පිපෙන මල් අපී
උදේ රැයේ පිපී නටන
පාට සුවඳ මල් අපී

iii. හෝ හොහෝ හඬ නගයි
නිදියන්නෙ නෑ වගෙයි
රැළි නැගෙයි පෙණ ඉහෙයි
මුහුද නම් හරි දඟයි

3. **පහත දැක්වෙන පද සඳහා යෙදෙන බහු අර්ථ පද, දී ඇති පදවලින් තෝරා ලියන්න.**

පිය, මුව, තෙර, වස්, සමය

මුඛය	තාත්තා	යුගය
වර්ෂය	ආගම	ප්‍රිය
මුවා	සඳහා	තීරය
පියවර	වයස	වෙරළ
ස්ථවිර	මුහුණ	

4. **නොගැළපෙන වචනය තෝරන්න.**

i. සඳ, කාලය, චන්ද්‍රයා, උතුම්, දාන

ii. දද, කිලිටි, බමුණු, කොඩි, කුෂ්ඨ

iii. පොළොව, මීයා, මීපැණි, මදුවිත, මිනිසා

iv. සමර, අනංගයා, ජය, සිහිකිරීම, පාට වර්ගයක්

v. මල, කිලිටි, දැවීම, මල්ලී, පුෂ්පය

5. **පහත පදවලට බහු අර්ථ පද සොයා ලියන්න.**

i. තිර ii. සක්

iii. පර iv. පත්

6. **පහත සඳහන් වාක්‍යාංශවලට තනි පද ලියන්න.**

i. කාලයට උචිත -

ii. බොහෝ ඇසූ පිරූ තැන් ඇති -

iii. දියෙහි හැසිරෙන -

iv. අඩක් සාගරයෙන් ද ඉතිරිය ගොඩබිමින් ද වට වූ ප්‍රදේශය -

v. අහසත් පොළොවත් එකට ගැටෙන සේ පෙනෙන ස්ථානය -

vi. පාද බොහෝ ගණනක් ඇති -

vii අනුන්ගෙන් පෝෂණය වන -

viii. දිය ගොඩ දෙකෙහි ම වසන -

ප්‍රායෝගික අභ්‍යාස

1. ළමා ගීත ඇතුළත් ශ්‍රව්‍ය සංයුක්ත තැටි අසා රස විඳින්න.
2. ඔබ සිත් ගත් ළමා ගී එකතු කරන්න.
3. ඒවායේ නිර්මාණකරුවන් පිළිබඳ තොරතුරු විමසන්න.
4. විවිධ තේමා යටතේ විකාශනය වන ගුවන්විදුලි වැඩසටහන් කීපයකට හොඳින් සවන් දී, ඒ ඒ වැඩසටහන් පිළිබඳ තොරතුරු වෙන වෙන ම පහත වගුවට අනුව ගොනු කරන්න. සවන් දුන් සියලු වැඩසටහන් පිළිබඳ ගොනුවක් සකසා පන්ති කාමරයේ දී මිතුරන් සමග හුවමාරු කර ගනිමින් අවබෝධ කර ගන්න.

ගුවන්විදුලි නාලිකාව	
වැඩසටහනේ නම	
ප්‍රචාරය වූ වේලාව	
උගත් කරුණු	